# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 571/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 02/04/2024<br>පැය 1620 |

# මාධ්‍ය නිවේදනය

## පාසල් දරුවන් මත් උවදුරින් මුදවා ගැනීමේ "සුරක්ෂිත හෙට දවසක් ව්‍යාපෘතිය" යටතේ විශ්වවිද්‍යාල සිසුන් බල ගැන්වීමේ වැඩමුළුව

**පාසල් දරුවන් මත් උවදුරින් මුදවා ගැනීමේ "සුරක්ෂිත හෙට දවසක් ව්‍යාපෘතිය"** යටතේ පාසල් සිසුන් බල ගැන්වීමේ වැඩමුළුවක් බස්නාහිර පළාත් ආණ්ඩුකාර මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝස් රොෂාන් ගුණතිලක මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතාගේ, බස්නාහිර පළාත් භාර ජ්‍යොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා සහ කෑගල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රොෂාන් රාජපක්ෂ මහතාගේ සහභාගීත්වයෙන් 2024.04.02 වන අද දින පෙ.ව 0800 කොළඹ 10 පිහිටි අශෝක විද්‍යාලයේදී දී පැවැත්විණි.

ශ්‍රී ලංකා පොලිසිය, ජාතික තරුණ සේවා සභාව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය එක්ව ක්‍රියාත්මක කරනු බලන මෙම වැඩසටහන මගින් විශ්වවිද්‍යාල සිසුන් විසින් අශෝක විද්‍යාලයේ පංතිකාමර වෙත ගොස් පාසල් ළමුන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගැනීම වෙනුවෙන් දැනුවත් කිරිමේ දේශනයක් සිදු කරන ලද අතර ඒ පිළිබඳව දැනුවත් කරමින් පාසල් දරුවන් වෙත පොත් පිංචයක්ද බෙදා දීම සිදු කරන ලදි.

මෙම අවස්ථාවේදී වැඩමුළුව සාර්ථක කර ගැනීම සඳහා දක්වන ලද සහයෝගය වෙනුවෙන් විශ්ව විද්‍යාල සිසුන් වෙත පොලිස්පති තුමා විසින් සංකේතාත්මතකව සහතිකපත් බෙදා දීමක් සිදු කරන ලද අතර මෙම අවස්ථාවට අශෝක විද්‍යාලයේ විදුහලපති, පාසල් ළමුන්, ගුරුභවතුන් පාසල් ළමුන්ගේ දෙමව්පියන් ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් රැසක් සහභාගී විය.

ඡායාරූප






2024-04-02
මත්ද්‍රව්‍යයෙන්
තොර සුරක්ෂිත
රටක්...
12-A
12A


BOC


හෙටක්
NYSC
LOLC


12-A




**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**